## Abstract No 96

# සෞන්දරනන්ද මහාකාව්‍යයෙන් ප්‍රතීයමාන වන සමකාලීන කාන්තාවන්ගේ ශරීරාලංකරණ විධි පිළිබඳ විමර්ශනයක්

ජේ.පී.පී. හිරුණිකා

සිංහල (විශේෂවේදී) දෙවන වසර, කැලණිය විශ්වවිද්‍යාලය

ඩී.එච්.සී.ඒ. ප්‍රියදර්ශනී

සිංහල (විශේෂවේදී) දෙවන වසර, කැලණිය විශ්වවිද්‍යාලය

සෞන්දරනන්ද මහාකාව්‍යය සංස්කෘත සාහිත්‍යයේ ප්‍රථම මහාකාව්‍ය රචකයා වන අශ්වඝෝෂ හිමියන් විසින් රචනා කරන ලද්දකි. මෙම නිර්මාණයේ දී උචිත භාෂාවක් කාව්‍ය ගුණයෙන් අනූන කොට ගනිමින් නන්ද කුමරාගේ කතාව නිරූපණය කිරීම කතුවරයාගේ අභිප්‍රාය වී ඇත. සෞන්දරනන්ද මහාකාව්‍යයෙහි උද්‍යාන , වන , මධුපානෝත්සව , උදය , සන්ධ්‍යා හා රාජ සභා ආදි වර්ණනා ඇතුළත් නොවන අතර තෝරා ගත් කතා වස්තුව තම කාව්‍ය අභිමතාර්ථයට අනුකූල ව මනාව විකාශනය කොට ඇත. ඒ අනුව මෙම අධ්‍යයනයෙහි අරමුණ වන්නේ ක්‍රි.පූ 75ත් ක්‍රි.ව 125ත් අතර කාලය තුළ රචනා වූ සෞන්දරනන්ද මහාකාව්‍යය තුළින් සමකාලීන කාන්තාවන් භාවිත කළ ශරීරාලංකරණ විධි පිළිබඳ තොරතුරු ප්‍රතීයමාන වන ආකාරය සාකච්ඡා කිරීම වේ. සෞන්දරනන්ද මහාකාව්‍යයේ 4, 6, 7, 8 යන සර්ග පිළිබඳ පමණක් මෙම අධ්‍යයනයට සීමා කොට ගැනේ. ඒ අනුව ප්‍රාථමික මූලාශ්‍රය ලෙස සෞන්දරනන්ද මහාකාව්‍යය ද ද්විතීයික මූලාශ්‍රය වශයෙන් ඒ ආශ්‍රිත ව රචනා වූ විචාර ග්‍රන්ථ ඇසුරෙන් කරන ලද දත්ත විශ්ලේෂණයක් පර්යේෂණයේ ක්‍රමවේදය ලෙස යොදා ගැනුණි. එකල භාවිත කළ සුවඳ විලවුන් , ආභරණ , විවිධ ආලේපන හා වස්ත්‍ර පිළිබඳ ව මෙහි දී තොරතුරු ලබා ගත හැකි ය. ඒ අනුව සෞන්දරනන්ද මහාකාව්‍යය, සමකාලීන කාන්තාවන් භාවිත කළ ශරීරාලංකරණ තොරතුරු ප්‍රතීයමාන වන වටිනා සාහිත්‍යමය මූලාශ්‍රයක් බව මෙම අධ්‍යයනය මගින් නිගමනය කළ හැකි ය .

**ප්‍රමුඛ පද :-** අශ්වඝෝෂ හිමි, නන්ද කුමරා , සංස්කෘත සාහිත්‍යය, සෞන්දරනන්ද මහාකාව්‍යය, ශරීරාලංකරණ